**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - 2016**
**-------------------------------------------------------------------**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය මත මණ්ඩලයේ ගනුදෙනු පිළිබඳ විගණකාධිපති වාර්තාවෙහි කෙටුම්පත 2018 නොවැම්බර් 30 වන දින මණ්ඩලයේ සභාපති වෙත නිකුත් කරන ලදී. ඊට වැඩිමනත් වශයෙන් මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI-1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2 මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**----------------------------------------------**

**2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**---------------------------**

මණ්ඩලය විසින් තොග පිරිවැයට අගය කළ බව හෙළිදරව් කර තිබූ නමුත් සියළුම තොග අගය කිරීම සඳහා එම ප්‍රතිපත්තිය අනුගමනය කර නොතිබුණි. ඒ අනුව නියැදි පරීක්ෂාවට ලක්වූ භාණ්ඩ වර්ග 27 කට අදාල තොග අයිතමයන් පිරිවැය හැර වෙනත් පදනම් යටතේ අගය කර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ අවසාන ශේෂය රු.30,442,949 ක් වූ නමුත් ඊට අදාළ මුදල් පොතෙහි ශේෂය රු. 26,850,159 ක් වූයෙන් රු. 3,592,790 ක් වූ වියදම් නොකරන ලද ප්‍රාග්ධන ප්‍රදානය මුදලින් නියෝජනය නොවන බව නිරීක්ෂණය විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දින වන විට කෙරීගෙනයන වැඩ ගිණුමෙහි මධ්‍යගත වායුසමීකරණ පද්ධතිය සඳහා පැවති රු. 39,206,047 ක් වූ නොනිමි වැඩ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඉඩම් සහ ගොඩනැගිලි වත්කම් පංතියට එකතු කර දක්වා තිබුණු අතර නොනිමි වැඩ ඇගයීමේ පදනම පිළිබඳ පැහැදිලි කර නොතිබුණි.

(ඇ) දේශීය හා විදේශීය විවිධ පොත් පරිත්‍යාගශීලී ආයතන හා පුද්ගලයින් වෙතින් මණ්ඩලයට ලැබෙන පොත් සම්බන්ධයෙන් ඒවා භාරගැනීම, ලේඛනගත කිරීම හා එම වත්කම්වල ආරක්ෂාව පිළිබඳව මණ්ඩලය විසින් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ අතර එම ප්‍රකාශන අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල රු. 3,955,074 ක් ලෙස දක්වා තිබුණු පොත් තොගයෙහි වටිනාකම තොග සමීක්ෂණ වාර්තාව අනුව රු. 4,974,955 ක් වූයෙන් තොග සමීක්ෂණ වාර්තාවට වඩා රු. 1,019,881 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද 2012 වර්ෂයේ සිට පැවත එන රු. 4,909 ක තොග ඌණතාවය පිළිබඳ වගකිවයුතු අය හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට කාර්යාල ලිපි ද්‍රව්‍ය හා පුස්තකාල ලිපි ද්‍රව්‍ය තොගය, තොග සමීක්ෂණ වාර්තාව අනුව රු. 1,049,639 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව රු. 1,106,549 ක් වූයෙන් රු. 56,910 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට රු.248,496 ක් වූ විවිධ අත්තිකාරම් ශේෂය වර්ෂ 8 කට වඩා වැඩි කාලයක් ගතවී තිබූ නමුත් 2018 දෙසැම්බර් 26 දින වන විටත් පියවා නොතිබුණි. මෙයින් රු.121,970 ක වටිනාකමක් වූ ශේෂය හඳුනාගත නොහැකි අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වර්ෂ 3 සිට වර්ෂ 11 දක්වා පැරණි රු.324,051 ක් වූ රඳවා ගැනීම් බදු මුදල් 2018 දෙසැම්බර් 26 දින දක්වාම දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ආපදා ණය ශේෂය රු.12,392,992 ක් වූ අතර ආපදා ණය ලේඛනය අනුව ශේෂය රු.12,457,569 ක් වූයෙන් රු.64,577 ක වෙනස හඳුනාගත නොහැකි ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි.

### 2.4 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 110 | හානි පිළිබඳ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 371 | අවශ්‍යතාවය නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම නිසා කමිටු රැස්වීම් හා විවිධ මිලදී ගැනීම් සඳහා අවස්ථා 26 කදී ලබා දී තිබූ රු.1,060,650 ක් වූ අත්තිකාරම් මුදලින් රු.307,866 ක් ආපසු පියවා තිබූ අතර අවස්ථා 6 කදී ලබාදී තිබුණ රු.24,500 ක අත්තිකාරම් මුදල්, වියදම් කිරීමකින් තොරව, නැවත පියවා තිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 702(3) | මුදල් රෙගුලාසි ප්‍රකාර කොන්ත්‍රාත් ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iv) මුදල් රෙගුලාසි 1646 | වාහන භාර නිලධාරින් විසින් වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊළඟ මාසයේ 15 වන දිනට ප්‍රථමයෙන්, ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත ද සමඟ ඒ ඒ මාසයේ ධාවන සටහන් තම දෙපාර්තමේන්තු ප්‍රධානින්ගේ මාර්ගයෙන් විගණකාධිපති වෙත යැවිය යුතු නමුත් එසේ සිදුකර නොතිබුණි. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | |
| | i. ඡේද අංක 2(ආ) | වත්කම් හඳුනාගැනීම, ගිණුම්ගත කිරීම හා ඒවායේ පාලනය පහසුකරවීම් වස් එක් එක් ස්ථාවර වත්කම් වෙනුවෙන් දෙපාර්තමේන්තුමය අංක ඇතුළත් ලේඛනයක් (පොදු ආ 290) පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| | ii. ඡේද අංක 2(ඉ) | ස්ථාවර වත්කම් ලේඛනයෙහි සටහන්වී ඇති මූල්‍ය දත්තයන් ස්ථාවර වත්කම් ලෙජරයෙහි සටහන්වී ඇති මූල්‍ය දත්තයන් හා සැසඳිය හැකි පරිදි පොදු ආකෘති පත්‍ර 287 ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) | 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 7 වගන්තිය | අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය යටතේ කමිටු පත් කිරීම හා ඒවායේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් රීතීන් සැකසීම මණ්ඩලය විසින් සිදුකළ යුතු වුවත්, එකතු සංවර්ධන ප්‍රතිපත්තිය යටතේ ප්‍රකාශන මිලදී ගැනීම් නිර්ණය කිරීමේ කමිටුව පත් කිරීමේදී අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර කමිටුවේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් රීතීන් සකස් කිරීම සිදුකර නොතිබුණි. ඒ අනුව කමිටුවේ සංයුතිය, පත්කිරීම් පිළිබඳ විධිවිධාන, සන පූර්ණය, කමිටුවේ විෂය පථය යනාදිය සම්බන්ධව පරීක්ෂා කිරීම සඳහා නිර්ණායකයන් නොතිබුණි. |
| (ඈ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි/ඒ/අයි/ 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඉ) | 2009 සැප්තැම්බර් 01 දිනැති හා අංක DMA/2009(2) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පිරිවැය වටිනාකම රු. 103,265,566 ක්වූ ජාතික පුස්තකාල පොත් තොගය 1976 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වසර 37 කින් සමීක්ෂණය කර නොතිබුණු නිසා පොත් සංචිතයේ නිවැරදිභාවය හා සුරක්ෂිතභාවය පිළිබඳ සෑහීමට පත්විය නොහැකි විය. |

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 14,817,209 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.10,185,344 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,631,865 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය ප්‍රදාන රු. 9,850,000 කින් වැඩිවී තිබූ නමුත් පරිපාලන වියදම් රු.10,451,450 කින් වැඩිවීම සහ පුස්තකාල සේවා වියදම් රු. 3,829,214 කින් වැඩිවීම සහ රු. 1,793,868 ක්වූ දේපල පිරියත හා උපකරණ විකුණුම් අලාභය ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.11,579,955 ක් වූ ඌනතාවය සමාලෝචිත වර්ෂය වන විට රු. 14,817,209 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි. එහෙත් සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේ දී රු.50,364,487 ක් වූ මණ්ඩලයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.90,504,497 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

#### 4.1.1 සැලසුම් කිරීම

---------------

සමාලෝචිත වර්ෂය තුළ දී ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරන ලද රු.58,400,847 ක වියදමින් රු.11,451,591 ක් 2016 වර්ෂය සඳහාද රු.46,949,256 ක් 2015 යන වර්ෂය තුළ ආරම්භ කරන ලද ප්‍රසම්පාදන කාර්යය සඳහාද වැයකර තිබුණි. එසේ වුවද 2015 වර්ෂයට සැලසුම් කරන ලද නමුත් නිම කිරීමට නොහැකි වූ කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළ දී අවිච්ඡින්න වැඩ ලෙස ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය සහ සමාලෝචනය

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙළුම් හතරකින් හා ප්‍රස්තාවනාවකින් යුතු පන්සියපනස් ජාතක පොත පොත් 5 කින් සමන්විත වේ. එය නැවත මුද්‍රණය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට පවරා තිබූ නමුත් එම කටයුතු සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් නැවත මුද්‍රණ කටයුතු මණ්ඩලය විසින් සිදුකිරීමට 2015 වර්ෂයේදී අනුමැතිය ලබාගෙන තිබුණු අතර පොත් 5 න් ප්‍රස්ථාවනාව සහ වෙළුම් 2ක් 2017 වසර තුළ නිමකර තිබුණි. III හා IV වෙළුම් 2 ක විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 01දක්වාත් නිමකර නොතිබුණි.

(ආ) 1850 වර්ෂය දක්වා ප්‍රකාශනයට පත්ව ඇති පැරණි සාහිත්‍ය ග්‍රන්ථ නාමයන් සහ 1851 සිට 2000 වර්ෂය තෙක් එයට අදාළව ප්‍රකාශයට පත්ව ඇති සංස්කරණයන් ඇතුළත් කරමින් සාධිකාරී සිංහල ග්‍රන්ථ නාමලේඛනය සම්පාදනය කිරීමේ කටයුතු 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි සැලසුම් කර තිබූ නමුත් විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 01 දක්වාත් නිමකර නොතිබුණි.

(ඇ) ග්‍රන්ථ විඥාපන පාලන අංශය සහ ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට සැලසුම් කර තිබූ පහත සඳහන් ප්‍රකාශන සම්පාදන කටයුතු 2016 දෙසැම්බර් 31 දක්වාම අවසන් කර නොතිබුණි.

(i) ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියෙහි (ප්‍රවර්තන) 2015 ඔක්තෝබර් කලාපයේ සිට 2016 සැප්තැම්බර් කලාපය දක්වා කලාප 12 ක් භාෂාත්‍රයෙන් සම්පාදනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී සැලසුම් කර තිබුණද කාල පරිච්ඡේදයට අදාළ කලාප දෙකක් සම්පාදනය කර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියෙහි 2014 වර්ෂයේ ප්‍රකාශයට පත්වූ කලාප 12 හි තොරතුරු ඇතුළත් සමුච්චිත වෙළුම භාෂාත්‍රයෙන් සම්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද ඉංග්‍රීසි සහ දෙමළ කොටසෙහි කටයුතු නිම නොකිරීම.

(iii) සිංහල පරිවර්තන සාහිත්‍ය ග්‍රන්ථ නාමාවලිය (1947-2015) දත්ත පදනම සම්පාදනය නොකිරීම.

(iv) පුස්තකාල පර්යේෂණ අංශයට අදාළ ජාතික පුස්තකාල විමර්ශන සඟරාවේ කලාප දෙකක් සම්පාදනය නොකිරීම.

(v) ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාවේ 2015 හතර වන කලාපයේ සිට 2016 තුන්වන කලාපය දක්වා කලාප හතරින් දෙකක් සම්පාදනය නොකිරීම.

(vi) ශ්‍රී ලංකා පශ්චාත් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව 2011-2015 දත්ත පදනම සම්පාදනය නොකිරීම.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ සිට ත්‍රෛමාසිකව පළ කරනු ලබන ප්‍රලේඛා සඟරාවේ පළ කිරීම සඳහා ලිපි සපයා ගැනීමේදී සඟරාවේ සංස්කාරක විසින් ගනු ලබන තීරණ අනුව ලිපි තෝරාගෙන තිබූ නමුත් එය සුදුසු නිර්ණායක හඳුනා ගැනීමකින් තොරව සිදුකර තිබුණි.

(ආ) අලෙවියෙන් පසුව මුදල් ගෙවීමේ පදනම මත කතෘවරුන්ගෙන් ලබා ගෙන තිබුණු ප්‍රකාශන සහ මණ්ඩලය විසින් මුද්‍රණය කර අලෙවි කරනු ලබන ප්‍රකාශන අලෙවි කිරීමේදී කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද ස්ථිර මිල ප්‍රතිපත්තියක් හඳුන්වා දී නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) සම්භාව්‍ය කෘති නැවත මුද්‍රණය යටතේ බුත්සරණ ග්‍රන්ථය සංස්කරණය කිරීමට 2009 අප්‍රේල් 23 දින කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශය වෙත භාරදී තිබූ නමුත් සංස්කරණ කටයුතු නිමකළ යුතු දිනය පිළිබඳ සේවාදායක ආයතනය සමග එකඟතාවයකට පැමිණ නොතිබුණි. කෙසේ වුවද සංස්කරණ කටයුතු නිමකර එම ග්‍රන්ථය 2012 අගෝස්තු 13 දින

මණ්ඩලය වෙත භාරදී තිබුණි. පසුව අක්ෂර සංයෝජන කටයුතු සිදුකර මුද්‍රණය කිරීම සඳහා 2013 දෙසැම්බර් 02 දින අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත භාර දී තිබුණු අතර දෙපාර්තමේන්තුව විසින් අක්ෂර සංයෝජන කටයුතු පමණක් සිදුකර එය නැවත මණ්ඩලය වෙත පවරා තිබුණි. මණ්ඩලය විසින් සෝදුපත් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එය මුද්‍රණය කිරීම සඳහා මුද්‍රණායතනයක් වෙත 2017 සැප්තැම්බර් 11 දින භාරදී තිබුණද විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 01 දිනය දක්වාත් මුද්‍රණ කටයුතු අවසන් කර ලේඛනය ආපසු භාරදී නොතිබුණි.

(ඈ) මණ්ඩලය විසින් 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මුද්‍රණය කරනු ලැබූ රු.2,392,489 ක් වටිනා මණ්ඩලීය ප්‍රකාශන 3,187 ක තොගයක් සහ වටිනාකම සඳහන් නොවන ප්‍රකාශන 4,753 ක තොගයක් විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 01 දින වන විටද ගබඩාවේ සහ ග්‍රන්ථ විඥාපන පාලන අංශය තුළ ඉතිරිවී තිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** 2014 වර්ෂයේ භාවිතයෙන් ඉවත්කර තිබූ රිසෝග්‍රාෆ් යන්ත්‍රය සඳහා භාවිතා කිරීමට මිලදීගෙන තිබූ පාරිභෝගික ද්‍රව්‍යවලින් රු. 75,170 ක් වටිනා තොගයක් 2016 දෙසැම්බර් 31 දින වන විට ගබඩාවේ ඉතිරි වී තිබුණි.

(ආ) ප්‍රතිග්‍රහණ අංශය විසින් මිලදී ගන්නා ලද ප්‍රකාශන එම අංශය වෙත ලැබීමෙන් පසු පරිග්‍රහණ ලේඛනයේ ලේඛන ගත කිරීම, අංක කිරීම හා පරිගණක ගත කිරීමෙන් අනතුරුව ග්‍රන්ථ විඥාපන පාලන අංශය වෙතත්, එහි තොරතුරු පරිඝණක ගත කිරීමෙන් පසු පාඨක සේවා අංශය වෙතත්, නිකුත් කරනු ලබයි. එම කාර්යයන් සම්බන්ධ පරික්ෂා කිරීමේ දී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) ප්‍රතිග්‍රහණ අංශය විසින් ග්‍රන්ථ විඥාපන පාලන අංශය වෙත ප්‍රකාශන නිකුත් කිරීමේ දී පරිග්‍රහණ අංක අනුපිළිවෙලට ප්‍රකාශන නිකුත් කර නොතිබුණු අතර නිකුත් කිරීමේ ලැයිස්තු අංක ගත කර නොතිබුණි.

(ii) 2016 වර්ෂය තුළ මිලදී ගන්නා ලද ප්‍රකාශනවලට අදාළ නියැදි පරික්ෂාවේදී අනාවරණය වූ පරිදි ප්‍රකාශන ලැයිස්තු 17 කට අදාළ රු.1,651,165 ක් වටිනා සියලු ප්‍රකාශන පාඨක සේවා අංශය වෙත ලැබී නොතිබුණු අතර ප්‍රකාශන ලැයිස්තු 8 කට අදාළ රු.761,133 ක් වටිනා ප්‍රකාශන ග්‍රන්ථ විඥාපන පාලන අංශය වෙත ද ලැබී නොතිබුණි.

(iii) ප්‍රතිග්‍රහණ අංශය විසින් මිලදී ගන්නා ලද ප්‍රකාශන 893 කට අදාළව ලැයිස්තු පිළියෙල කර එම ලැයිස්තුවේ සඳහන් සියලුම ප්‍රකාශන පළමුව ග්‍රන්ථ විඥාපන පාලන අංශය වෙතත්, ඉන් පසුව පාඨක සේවා අංශය වෙතත් නිකුත් කිරීමේදී ප්‍රකාශන ලැයිස්තුවේ සඳහන් ප්‍රකාශනවලින් ප්‍රකාශන 179 ක් ග්‍රන්ථ විඥාපන පාලන අංශය විසින් පාඨක සේවා අංශය වෙත නිකුත් කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

(iv) පරිග්‍රහණ ලේඛනයේ ලේඛනගත කර වසරකට වඩා වැඩි කාලයක් ගතවී තිබූ නමුත් රු.19,382 ක් වටිනා ප්‍රකාශන 8 ක් ප්‍රතිග්‍රහන අංශය විසින් ග්‍රන්ථ විඥාපන පාලන අංශය වෙත නිකුත් කර නොතිබුණි.

(v) පරිග්‍රහණ ලේඛනයේ ලේඛනගත කරන ලද ප්‍රකාශන 1,300 ක් ග්‍රන්ථ විඥාපන පාලන අංශයට නිකුත් කිරීමේදී දින 225 සිට දින 621 දක්වා කාල ප්‍රමාදයන් සිදුවී තිබුණි.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කරන ලද වර්ෂය තුළදීම සිදු නොකිරීම නිසා රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ වසරින් වසර ඉතුරුවෙමින් පැවත ආ ශේෂය 2016 ජනවාරි 01 දිනට රු. 48,515,278 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා රු. 31,316,262 ක ප්‍රග්ධන ප්‍රදාන ලැබී තිබුණු අතර ඉන් රු.58,400,847 ක් වැයකර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සැලසුම් ප්‍රකාරව ඉටුනොකිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට රු 21,430,693 ක් උපයෝජනය නොකර රඳවා තබාගෙන තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත හා එහි පිටපත් අදාළ අමාත්‍යාංශයට, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවද, 2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ අවුරුදු 1මාස 9ක ප්‍රමාදයකින් පසුව 2018 දෙසැම්බර් 17 දිනදීය. තවද 2017 සහ 2018 ගිණුම් වර්ෂයන් සඳහා මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය දක්වාත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5.2 පොත්පත් හා ලේඛන පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් වැඩ හෝ සේවා සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ආ) 2016 සහ 2017 වර්ෂ සඳහා ලෙජර් ගිණුම් විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 01 දින දක්වාත් පවත්වාගෙන ගොස් නොතිබූ අතර වර්ෂ අවසානයේ ගනුදෙනු සාරාංශ කොට ලබාගත් ශේෂයන් පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණු නමුත් එය විගණනයේදී පිළිගත නොහැකි තත්ත්වයක් විය.

## 5.3 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේදී ආරම්භ කර 2016 වර්ෂයේ නිම කිරීමට නියමිතව තිබූ රු.75,000,000 ක් වටිනා මධ්‍යගත වායු සමීකරණ පද්ධතියේ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනමා තිබුණි. අදාල කටයුතු 2017 වර්ෂය වන විට නිම කර නොතිබුණු අතර ඒ සඳහා රු.2,299,176 ක් වූ උපදේශක ගාස්තු ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට ගෙවා තිබුණි.

(ආ) මණ්ඩලයේ අංශ කිහිපයක් විසින්ම මුද්‍රිත ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණු නමුත් වර්ෂය තුළදී කොපමණ මුද්‍රිත ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණේද යන්න පරීක්ෂා කිරීමට හැකි පරිදි තොරතුරු ලේඛන ගත කර නොතිබුණු අතර 2016 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම තුළ ඒ සඳහා සැලසුම් කර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන සැලැස්ම සඳහා කළමනාකරණ මණ්ඩලයේ සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2016 ජනවාරි 1 දිනට පෙර ලබාගෙන නොතිබුණු අතර පිළිවෙලින් 2016 පෙබරවාරි 29 දින හා 2016 මැයි 02 දින ලබාගෙන තිබුණි.

(ඈ) රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය 2006 හි යොමු අංක 4.2.1 හි සවිස්තර ප්‍රසම්පාදන සැලැස්ම සඳහා වන ආකෘතියට අනුකූලව ආයතනයේ සවිස්තර ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කර නොතිබුණි.

## 5.4 අය වැය ලේඛනමය පාලනය

අය වැයගත හා තත්‍ය ආදායම් වියදම් අතර සියයට 24 සිට සියයට 93 ක් අතර පරාසයක් තුළ සැලකිය යුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5.5 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන කාර්යාල ලී බඩු උපකරණවල පිරිවැය වටිනාකම වූ රු.23,089,464 ක් තුළ වටිනාකම රු.936,787 ක් වූ ජංගම වත්කම් තොගයක් ඇතුළත්වී තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල එකතු වටිනාකම රු.1,306,632 ක් වූ වත්කම්වලට අදාළ වත්කම් පංතිය හඳුනා නොගැනීම හේතුවෙන් එම වත්කම් ක්ෂය කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | වත්කම් පාලනය | (i) | වත්කම් ලේඛනගත නොකිරීම. |
| | | (ii) | පොත් පරිත්‍යාග ලේඛනගත නොකිරීම. |
| (ආ) | ගිණුම්කරණය | (i) | මූල්‍ය ප්‍රකාශන නියමිත වේලාවට ඉදිරිපත් නොකිරීම. |
| | | (ii) | ලෙජර ගිණුම් හා උපලේඛන අතර නොසැසඳීම් පැවතීම |
| | | (iii) | ලෙජර ගිණුම්හි සටහන් තැබීමේ දී වවුචර් අංක සඳහන් නොකිරීම. |

| | | | |
|---|---|---|---|
| | | (iv) | ගබඩා තොග පාලන ලෙජරය පවත්වාගෙන නොයාම |
| | | (v) | ලෙජර ගිණුම් යාවත්කාලීනව පවත්වාගෙන නොයාම. |
| | | (vi) | අවලංගුකළ චෙක්පත් ලේඛනයක් පවත්වාගෙන නොයාම. |
| | | (vii) | වැය ලෙජරයෙහි සහ ලෙජරයෙහි සටහන් අධීක්ෂණ නිලධාරියා විසින් සහතික නොකිරීම. |
| (ඇ) | ප්‍රසම්පාදනය | (i) | සැලසුම් අනුව කටයුතු නොකිරීම. |
| | | (ii) | කොන්ත්‍රාත් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන නොයාම. |
| | | (iii) | භාණ්ඩ මිලදී ගැනීමේ ඇණවුම් පිටපත් ගිවිසුම් ලිපිගොනුවෙහි ඇතුළත් නොකිරීම. |
| | | (iv) | අත්තිකාරම් මුදල් පියවීමේ වවුචර් සහතික කර ලේඛනගත කිරීම ප්‍රමාද වීම. |
| (ඈ) | මුද්‍රිත ද්‍රව්‍ය මිලදී ගැනීම | (i) | සැලසුම් නොකිරීම |
| | | (ii) | පූර්ව අවශ්‍යතාවන් හඳුනා නොගැනීම |
| (ඉ) | වාහන පාලනය | (i) | දෛනික ධාවන සටහන් පොත් නිසි පරිදි නඩත්තු නොකිරීම |
| | | (ii) | ඉන්ධන ඇමුණුම් පත්‍රයෙහි යොමුව ධාවන සටහන්හි සටහන් නොකිරීම |
| | | (iii) | ධාවන සටහන් පොතෙහි ධාවනය කරන දුර ප්‍රමාණය නිවැරදිව සටහන් නොකිරීම |